# දිවයිනක වන සම්පත් මහා බලවතුන් සිව්දෙනා

ලාල් ඇන්තනීස්

වර්ග සැතපුම් 25000 ක භූමි ප්‍රමාණයක් ඇති ශ්‍රී ලංකාව කුඩා දිවයිනකි. එයින් දහයෙන් පංගුවක පමණ පෙදෙසක් තව ම වනය යි. එහෙයින් ම, රටෙහි භූමි ප්‍රමාණය හා සසඳන කල, දකුණු ආසියාවේ වන සතුන් වසන බිම් ඇති රටවල් අතුරින් පොහොසත් ම එකක් ලෙස ශ්‍රී ලංකාව ගැනෙයි. වන සතුන් පමණක් නොව, ඔවුන් වසන පරිසරය හා ඔවුන් ගේ ගණාවාස ද ඒ හා සමව ම පොහොසත් ය විවිධත්වයෙන් යුක්ත ය. ප්‍රාකෘතික වනයක් සේ සැලකෙන අක්කර 21000 ක් විශාල වූ සිංහරාජ වනාන්තරයේ සිට, ගැඹුරු ද්විතීයික වනාන්තර ඔස්සේ කටුපඳුරුවලින් ගහන තැනිතලා බිම් හා වියළි, පහත් බිම්වල කඩොලාන වගුරු බිම් දක්වා ඒවා විවිධ වෙයි. දැවැන්ත වල් අලින් සැරිසරන, ගංවතුරට නිතර යට වෙන මහවැලි තැන්නේ සිට වැල් වලින් ආකුල වූ දැඩි උෂ්ණත්වය රැඳී තෙත් කලාපීය වනාන්තර දක්වා ද කුඩැල්ලන්ගෙන් ගහන වූ මීදුම් සළු පැළඳි කඳුකර වනාන්තර වල නිසල සුන්දරත්වය දක්වා ද මෙම පරිසරය විවිධ වෙයි.

වනාන්තරයේ මහා බලවතුන් වශයෙන් හැඳින් වෙන අලියා, දිවියා, වලහා, කුළු හරකා වැනි විශාල වන සත්තු, පහත රට වියළි කලාපයට සහ තෙත් කලාපයේ පහත් කඳුවැටිවලට සීමා වෙති. දිවියා කඳුකර ප්‍රදේශයෙහි දී ද දක්නට ලැබෙයි. එම පළාත්වල උඟ හොඳින් ඇති දැඩි වෙයි.

මේ විශාල සතුන් අතරින් විශේෂතමයා දිවියා බවට සැකයක් නැත. සංචාරකයන් බොහෝ දෙනකු මෙන් ම වන සත්ව විශෙෂඥ යන් ද පවසා ඇති පරිදි, මේ සතුන් වනයේ ම දැක ගත හැකි ස්ථාන අතුරින් ලෝකයේ ඇති හොඳ ම ස්ථානය ශ්‍රී ලංකාව යි. මේ ලේඛකයා හා සාකච්ඡාවේ යෙදුණු ජර්මන් ජාතික වන සත්ව ඡායාරූප ශිල්පියකු පැවසුවේ අප්‍රිකාවේ ගත කළ සොළොස් අවුරුදු කාලය තුළ ඔහු දුටුවේ දිවියන් හය දෙනකු බවත්, ශ්‍රී ලංකාවේ ගත කළ දෙවසර තුළ දෙසියයකට අධික සංඛ්‍යාවක් දිවියන් දක්නට ලැබුණු බවත් ය. තාවකාලික ව වසා දමන තුරු විල්පත්තු අභය භූමිය

මෙම විශාල සතුන් දැක ගැනීමට තිබූ හොඳම භූමිය විය. දකුණේ ඇති යාල අභය භූමිය ද දිවියන් පිළිබඳ ව මෑතක සිට ලා ඇත. මධ්‍යම කඳුකරයේ සැඳැල්ල වැනි වූ අඩි 7200 ක උසින් යුත් හෝර්ටන් තැන්න දිවියන් දැක ගත හැකි තවත් බිම් පෙදෙසකි. එහෙත් මෙහි වසන දිවියෝ නිශාචරයෝ ය. ලජ්ජාශීලී ය. ඒ නිසා ම ඔවුන් දැක ගැනීම එතරම් පහසු නොවේ. පහත් බිම් පෙදෙස් හි පඳුරු සහිත බිම් හි මෙන් ම වනාන්තරවල ද ඔවුන් දැක ගත හැකි ය. එහෙත් එහි දී ද ගල් වැටි සහිත පෙදෙස්හි හා වැලි සහිත පෙදෙස් හි ද විසීමට ඔව්හු වඩාත් ප්‍රිය කරති. තිත් මුවා සහ ගෝනා ඔවුන්ගේ ගොදුරු වන අතර වඳුරා සහ ගම්වාසී බල්ලන් ද ඔව්හු දඩයම් කරති.

ශ්‍රී ලංකා ඉතිහාසයේ මිනී මස් කන දිවියන් දෙදෙනකු ගැන වාර්තාගත ව ඇත. මේ අතරින් වඩාත් ප්‍රසිද්ධියක් ලබා ඇත්තේ පූනානිහි මිනී කන දිවියා ය. උඟ ඒ නම ලබා ඇත්තේ උඟ සැරිසැරූ ප්‍රදේශය වන, නැගෙනහිර වෙරළ බඩ ගමක් වන පූනානි නම් කුඩා ගම්මානය නිසා ය.

ඉන්දියාවේ ලෝක ප්‍රකට රුද්‍රප්‍රයාග්හි මිනී කන දිවියා හා සමකාලීනයකු වූ ඌ මිනිසුන් විසිදෙනකු මරා දැමූ බවට වාර්තා ගත ව ඇති අතර, 1923 දී වෙඩි තබා මරා දමන ලදී. වියලූ සම පුරවා සාදන ලද උගේ අනුරුව දැනට කොළඹ කෞතුකාගාරයේ මහජන ප්‍රදර්ශනය සඳහා තබා ඇත. අනෙක් මිනී කන දිවියා නම් පොත්තන දිවියා ය. 1950 ගණන්වල දී ලංකාවේ ගිනිකොන ප්‍රදේශයේ පොතුවිල් - කතරගම පෞරාණික ගමන් මාර්ගය උගේ දඩබිම විය. එම දිවියා පිළිබඳ එතරම් පැහැදිලි තොරතුරු නැත.


සංඛ්‍යා ලේඛනගත කිරීමක් කර නොමැති වුව ද මේ අලංකාර සතා දැනට වඳ වී ගෙන යන සත්ව ගණයට අයත් බවට සැකයක් නැත. දැඩි ආරක්ෂාවට ලක් වූව ද දිවියාගේ ලස්සන හම සඳහා උන් වෙඩි තැබීම්වලට ලක් වූ වාර ද, සමහර විට විෂ කවන ලද අවස්ථා ද ඇත.

වලස් වර්ග අතරින් මෙහි දක්නට ඇත්තේ එක් වර්ගයක් පමණි. උගේ හමදිග, රළු, තද කළු පැහැති මයිල්වලින් ගන ව වැසී ඇත. ඇට වලින් ම මෙන් සෑදුණු උගේ දික් වූ හොම්බ වැකුම් ක්ලීනරයක් මෙන් (රික්ත ශොධකය කින් මෙන්) වේ. හුඹස් වලින් වේයන් උරා ගැනීමට හැකි වන සේ සෑදුණකි. විශේෂ යන වනචාරී මිනිසුන් අතර දුෂ්ටයකු සේ ගැනෙන සත්වයෙකි වලසා. එහෙත් ඇත්ත වශයෙන් ම ඌ ස්වභාවයෙන් ම මුදු ගති ඇති සත්වයෙකි. කෝප ගැන්වූ විට හෝ තම පැටවුන් ආරක්ෂා කිරීමෙහි දී හෝ ඌ රකුසාගේ ම ප්‍රතිමූර්තියක් වැනි ය. කෙනකු හපයක් කර දමන යන්ත්‍රයක් මෙනි. ශ්‍රී ලංකාවේ වනාන්තරවල දක්නට ලැබෙන ඉතා ම සිත් ඇද ගන්නා සුළු දර්ශනයක් නම් මව් වලහා තම පැටවුන් දෙනුන් දෙනකු කර පින්නා ගෙන යන ආකාරයයි. වලහා ශාක භක්ෂකයෙකි. එහෙත් පහසුවෙන් ලැබුණ හොත් මස් කුනපයක රස විඳී.

ජාතික වනෝද්‍යානයන්හි වලහා දැක ගත හැකි පහසු ම කාලය වනුයේ උගේ ප්‍රියතම ගෙඩි වර්ගය වන පලු(මනිල්කරාහෙක්සෙන්ඩ්‍රා) ඉදෙන කාලයයි. මේ කාලය නම් මැයි මස අග සිට ජූනි මස දක්වා කාලය යි.

වියළි කලාපයේ වන ලැහැබවල කුළු හරක් බහුල ව දක්නට ලැබෙති. අවට ගම්වල හීලෑ මීහරක් සමග උන් නිතර එක් ව සිටිනු දක්නට පුළුවන. එම වර්ගය
අප්‍රිකාවේ දක්නට ලැබෙන කේප් මී හරක් වර්ගයට වඩා ප්‍රමාණයෙන් කුඩා ය. එසේ වුව ද ඌ ශක්තිමත් සත්වයෙකි. කිසි ම කෝප ගැන්වීමක් නොමැති ව පහර දෙන සත්වයකු ලෙස නම් දරා ඇත්තකු වුව ද නූතන පර්යේෂණ සහ නිරීක්ෂණ මගින් ඒ බවක් ඔප්පු වී නොමැති ය.

ශ්‍රී ලංකාවේ වනාන්තරවල සැරිසරන සතුන් අතුරින් වඩාත් ම තේජස් වී විලාසයක්



පෙන්නුම් කරනුයේ අලියා ය. කලකට පෙර ලංකාව පුරා ම අලි පැතිරී සිටිය හ. උස් බිම් පෙදෙස්වල පවා දක්නට ලැබිණි. විශේෂයෙන් ම යටත් විජිත කාලයන්හි දී ද, ඉන් පසුව ද අධික ලෙස වෙඩි තැබීම්වලට ලක් වූයෙන් අලි සංඛ්‍යාව ශීඝ්‍රයෙන් අඩු විය. දැන් ඔවුන්, වන සත්ව භාෂා ව්‍යවහාරයේ 'අලින්ගේ භූමිය' වශයෙන් හැඳින්වෙන, විවෘත තැනිතලාවල එතරම් ගන නොවූ, පඳුරු සහිත වන ලැහැබ් වලින් යුක්ත ප්‍රදේශවලට සීමා වී ඇත.

ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන්නේ එක ම අලි වර්ගයකි. ඒ 'ඉන්දියානු අලියා' (එලිෆාස් මැක්සිමස්) වශයෙන් හැඳින්වෙන වර්ගය යි. එසේ වුව ද ලංකාවේ විවිධ පළාත්වල දක්නට ලැබෙන අලි, උසින් මහතින් වෙනස් වෙයි. මේ වෙනස පරිසර හා ආහාරවල විෂමතා නිසා සිදු වූවක් විය හැකි ය. දිවයිනේ දකුණු පෙදෙස්හි හෙවත් රුහුණේ දක්නට ලැබෙන අලි ප්‍රමාණයෙන් කුඩා ය. පෙට්ටි හැඩයකට තරමකට හුරු ය. හිස පහත් කර ගෙන කරන්නා වූ ඔවුන්ගේ ඇවිදීම මේ සත්ව වර්ගය සාමාන්‍යයෙන් පිළිබිඹු කරන තේජාන් විත විලාසය නොදක්වයි. යාල අභය භූමියෙහි දක්නට ලැබෙන බොහොමයක් අලි, මෙම පෙදෙසේ ම බසින් හැඳින්වෙන අන්දමට, 'රුහුණු ගැටව්' ය. සමහර විට මේ අලි 'කුරු අලි' යනුවෙන් හැඳින්වෙති. මෙය නිවැරදි හැඳින්වීමක් යැයි කිව නොහැකි ය. මක්නිසා ද යත් මොවුන් අනෙකුත් අලි හා සංසන්දනය කරන විට ප්‍රමාණයෙන් කුඩා වුව ද, කිසි ම කුරු බවක් ඔවුන් තුළ නොපෙනන බැවිනි.

'සබරගමු වර්ගය' යැයි සමහර විට හඳුන්වන අලි වර්ගය තේජාන්විත විලාසයක් පිළිබිඹු කරයි. ඔව්හු උස ය; මනාව වැඩුණු ශරීරයකින් යුක්ත ය. විශාල අලියකුගේ උරහිස දක්වා උස අඩි අටකට වැඩි වෙයි. මොවුන් ගමන් කරනු කෙනෙකුගේ දර්ශන පථයට ලක් වීම ඇත්තෙන් ම චිත්තාකර්ෂණීය දර්ශනයකි. තම හිස කෙළින් කර ගෙන, වැදගත් ගම්භීර විලාසයක් දක්වමින් ඔව්හු ඇවිදිති. මේ අලි බොහොමයක ගේ හිස ම 'කුම්භස්තලය' නමින් හැඳින් වෙන මොල්ලියක් ඇත. අලියකුගේ වර්ගය හා කුලය විනිශ්චය කිරීමේ දී සලකා බලන ඉතා වැදගත් ලක්ෂණයක් වනුයේ උගේ නළල් තලයේ පළල යි.

මධ්‍යම කඳුකරයේ දකුණු පෙදෙස්හි ඇති කුඩා කඳු වැටි සහිත සබරගමු ප්‍රදේශයට පමණක් මෙම අලි සීමා නොවෙති. මේ අලි වර්ගය වඩා පුළුල් ව පැතිරී ඇත. දකුණේ පිහිටි යාල වනෝද්‍යානයෙහි පවා ඔව්හු දක්නට ලැබෙති. උඩ වළවේ, වස්ගොමුව සහ ගල්ඔය ජාතික වන උද්‍යානවල මේ අලි රංචු වශයෙන් දැක ගත හැකි ය. ගිනිකොන වෙරළ බඩ නගරයක් වන පොතුවිල් නගරයට සැතපුම් 14 ක් බටහිරින් පිහිටි ලාහුගල වනෝද්‍යානය වර්ග සැතපුම් හයක් විශාල ය. යාල හා ගල්ඔය එකට යා කෙරෙන වන බිම් තීරුව මැදම එය පිහිටා ඇත. මෙහි විශාල වැවක් ද වෙයි. අලින් ප්‍රිය කරන 'බෑරු' (ඔප්ලිස්ස්කෙම් පොසිටාස්) නම් උස් තණ කොළ වර්ගයකින් මේ වැව වැසී ඇත. විශාල රංචු වශයෙන් අලි දැක ගත හැකි ස්ථාන අතුරින් හොඳ ම ස්ථානය මෙය බවට සැකයක් නැත. මේ අලි රංචුවලට සබරගමු අලියෙකු ද ඇතුළත් වනු ඇත.

ප්‍රධාන අලි වර්ග අතුරින් තුන්වන වර්ගය නම් 'විල් අලියා' යනුවෙන් හැඳින්වෙන වර්ගය යි. විල් අලියා, මහවැලි නිම්නයේ ගං වතුරට යට වන පහත් බිම්වලට සීමා වෙයි. පොළොන්නරුව හා කන්තලේ පෙදෙස්වලට නැගෙනහිරින් මොව්හු දක්නට ලැබෙති. විල් අලියා විශාල ය. සමහර විශාල පිරිමි සතුන්ගේ උරහිස දක්වා උස අඩි දහයක් පමණ වෙයි. කන්තලේ නගර යට දකුණින් මහවැලි ඉවුරේ මේ යෝධ අලි ගිය අලිමංකඩක් හමුවීම පිළිබඳ අත්දැකීමක්

මේ ලේඛකයාට ද ඇත. එම අඩි මැන (අලියකුගේ අඩි සලකුණක වට ප්‍රමාණය මෙන් දෙක හමාරක ප්‍රමාණයක් උගේ උරහිස දක්වා උස සේ ගැනේ.) බලා, එම අලි උරහිස දක්වා අඩි දහයකට ආසන්න වූ බව නිගමනය කෙරිණ. විල් අලියා වෙනම වූ උප කුලයකට අයත් වේදැයි යන්න පිළිබඳව එක් කාලයක මත වාදයක් විය. එහෙයින් ම, නිල වශයෙන් නොපිළිගත්ත ද, එලිෆාස් මැක්සිමස් විල් අලියා ' යන විද්‍යාත්මක නාමය මේ වර්ගයට යෙදිණ. එහෙත් මෙම කරුණ මේ දක්වා ම තහවුරු වී නොමැත. මේ අලින්ගේ විශාල ශරීර, මොවුන් වාසය කරන වගුරු සහිත ගණාවාසවල විශේෂ වූ පාරිසරික සාධක හා ආහාර නිසා ඇති වූවක් බව විශේෂඥයන් කල්පනා කරන සේ ය. මාදුරු ඔය හා ගංවතුරට යට වන වෙනත් ගංගා නිම්නයන්හි ජාතික වනෝද්‍යාන පිහිටු වන ලද්දේ මේ විල් අලින්ගෙන් ඉතිරි වී ඇති පිරිස ආරක්ෂා කිරීම පිණිස ය.

සියලු ම අලි අතුරින් වඩාත් ම රාජකීය පෙනුමක් ඇත්තේත්, තේජස්වී විලාසයක් පෙන්නුම් කරනුයේත් වල් ඇතා ය. දඩයම් කරුවන් වඩාත් ම සොයා ගියේ ද මොවුන් නිසා දඩයම් කිරීමෙන් වඩාත් ම පීඩා වින්දේ ද ඇත්තු ය. මේ නිසා ම ශ්‍රී ලංකා වනාන්තරවල අතිදුර්ලභම සතා ඇතා ය. මෙම සතුන්ගේ නියත සංඛ්‍යා ලේඛන ලබා ගැනීම අසීරු ය. එහෙත් දෙසියයක් පමණ ඇතුන් වනාන්තරවල වෙසෙතැයි විශ්වාස කෙරෙයි. මෙම සංඛ්‍යාව සමහර විට අතිශයෝක්තියක් වුව ද විය හැකි ය. ස්ත්‍රී පුරුෂ දෙවර්ගයට ම දළ ඇති අප්‍රිකානු ඇතා (ලොක්සොඩොන්ටා අප්‍රිකානා) මෙන් නොව ඉන්දියානු අලි වර්ගයේ දළ ඇත්තේ පිරිමි වර්ගයේ ඇතුන්ට පමණි. අද පවා දඩයම්කරුවන් ඇතා සොයා යන්නේ ඇත් දළ නිසා ය. පසුගිය සත් අවුරුදු කාලය තුළ මෙම ලේඛකයාට ද දඩයම්කරුවන් විසින් දළ පිණිස වෙඩි තබා මරා දමන ලද ඇතුන්ගේ මළ සිරුරු දක්නට ලැබී ඇත. මේ අතර යාල අභයභූමියේ ප්‍රසිද්ධියට පත්ව සිටි ඇතකු වන 'පොඩි පුටුවුවා' ද විය 1986 දී අභය භූමියට මඳක් පිටත දී ඌ වෙඩි තබා මරා දමා තිබිණ. 1984 දී කච්චමුරුච්චන් නම් ගම්මානයේ දී අලංකාර ඇතකු ද, 1988 දී මනන්කැටිය වැව අසළ දී තවත් ඇතකු ද, මේ වසරේ අප්‍රියෙල් මාසයේ දී උට්ටිමඩුවෙ හි දී තේජාන්විත පෙනුමක් ඇති ඇතකු ද මරා දමා තිබිණ. මේ සියලු ම ඇතුන් මරා දමා තිබුණේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ ය.

පසුගිය දෙවසර ඇතුළත, යාල අභය භූමිය තුළ ඇතුන් කීප දෙනකු දක්නට ලැබීම සිත උනන්දු කරවන කරුණකි. අඩි දෙකක් උස පැටවකුගේ සිට අඩි නමයක් උස විශාල ඇතකු දක්වා විවිධ වූ උස ප්‍රමාණවලින් යුක්ත වූ ඇතුන් මෙසේ දක්නට ලැබී ඇත. මේ ලේඛකයා ද මෙහි දී ඇතුන් විසි දෙදෙනෙකු හඳුනාගෙන ඇත.

ඇතා පමණක් නොව ශ්‍රී ලංකාවේ මුළු වල් අලි වර්ගය ම සිය පැවැත් ම සඳහා විශාල සටනක යෙදී සිටිති. මේ සටන නිරර්ථක එකක් නොවේවා යැයි පරිසර සංරක්ෂකයෝ උදක් ම ප්‍රාර්ථනා කරති. අවසානාවකට මෙන් වෙනත් කරුණුවලට අමතරව, නොදැනුවත්කම නිසා ද අලින්ගේ ස්වාභාවික ගණාවාස ශීඝ්‍රයෙන් විනාශ වී යයි. බොහෝ පෙදෙස්වල, තම ගොවි බිම් නුසුදුසු ස්ථානයන්හි පිහිටුවා ගත් ගොවීන්ගෙන් මේ අලි හිරුහැර විඳිති. මේ ගොවි බිම් වඩාත් ම පිහිටුවා ඇත්තේ වසර දහස් ගණනක් තුළ අලින් ආ ගිය මං පෙත් හරහා ය. මෑතක දී මේ අලින්ගෙන් බොහොමයක් කුමන අසළ දී විනාශයට භාජනය වූ හ. එය උතුරේ ත්‍රස්තවාදීන්ගේ කාර්යයක් යැයි විශ්වාස කරන ලදී. විල්පත්තු අභය භූමිය තුළ දී තවත් සමහරකට විෂ ශරීර ගත කර ඇත.

ශ්‍රී ලංකාවේ ස්වාභාවික පරිසරය සුරැකීම පුරාණයේ සිට පැවැත එන සිද්ධාන්තයකි. පුරාණ වංශ කතාව වන මහාවංශය පුරා ම පැතිරී ඇති කියමන් මේ බවට සාධකයකි. නටබුන් නගරවල දක්නට ඇති සෙල්ලිපි ද මේ බව සනාථ කරයි. මේවා අතරින් වඩාත් ම වැදගත් වනුයේ පොළොන්නරුවේ රජ කළ නිශ්ශංකමල්ල රජ අනුරාධපුරයට ගිය අවස්ථාවක පිහිටුවන ලද, එකොළොස් වන ශත වර්ෂයට අයත් පුවරු ලිපිය යි. කෙළින් සිටුවන ලද පුවරුවක කොටා ඇති මේ ලිපිය දැනට අපගේ මහාස්තූපය වන රුවන්වැලි සෑ මළුවේ දක්නට ඇත.

පෞරාණික රාජ පරම්පරාවෙහි සම්ප්‍රදාය රකිමින්, සංවර්ධනය පසු පස හඹා එන විනාශයෙන් සහ වුවමනාවෙන් ම කරන විනාශයෙන් අපගේ වනාන්තර හා ඒවායෙහි වාසය කරන්නන් ආරක්ෂා කිරීමට දුෂ්කර වූත් වියදම් සහිත වූත් ක්‍රියා මාර්ග කිහිපයක් රජය විසින් ආරම්භ කර ඇත. ඒ හා සමග ම, තරුණ පරම්පරාව, විශේෂයෙන් ගම්බද පාසල් ශිෂ්‍යයන්, පරිසරය සුරැකීමට දක්වන උද්යෝගය සිත් උනන්දු කරවන සුළු ය. පැරණි රජවරුන්ගේ යහපත් ක්‍රියා කලාපයට අනුකූලව, ලෝකයේ ඇති පැරණිතම පරිසරය සුරැකීමේ සංගමය මෙම දිවයිනේ ම පිහිටුවා තිබීම ඇත්තෙන් ම සුදුසු ය. එනම් දැනට අනූහය අවුරුද්දක් ම ක්‍රියාකාරී ව පවතින 'ශ්‍රී ලංකා වන සත්ව හා ස්වාභාවික පරිසරය සුරැකීමේ සංගමය'යි. මෑතක දී පෞද්ගලික වශයෙන් කුරුලු සංගම් සහ සංරක්ෂණ සංගම් කිහිපයක් ම පැන නැගී ඇති අතර', මේ සෑම සංගමයක් ම මේ ඉතා වැදගත් කාර්යය සඳහා දායක වී ඇති ප්‍රමාණය සුළු කොට තැකිය හැකි නොවේ.